# 3

පුනීත තේ කෝප්පයෙන් පසු කාලිංග උපසේනව මහ මාලයට කැඳවා ගෙන ගියේය. ආවල් දැව තීරු ගෙළක් කෙළවර දෙසට ඇදී ගිය සළකුණක් මගෙක දකුණට ඇරෙන කාලිංග එහි කෙළවර දොරක් විවර කරමින් උපසේනට එතුළින් ඇතුළුවන්නට ඉඩ සැලසුවේ ගුප්ත විජ්ජාකාරයෙකු තිරයක් ඈර පෙන්වන්නාක් මෙන් මදක් ඉදිරියට නැමී අතක් පහතට විහිදුවා අත ගාන්නාක් සේ චලනයක් කරමිනි.

කාමරයේ බිම ලොකු තෙල ගඩොල් අල්ලා කොටසක් නිමුතුරු ආකාර වැසී තිබිණි. එක් පසෙක වූ විසාල කවුළුවෙහි වීදුරු මත්තේ හුමාලය බැඳුන බැවින් පිටත කිසිවක් පැහැදිලි නොවීය. තවමත් පිටත වැහි පොදය වැටුණි. කවුළුව තර ඇත් කරමින් කාලිංග පිටත බලද්දී උපසේනද එවම නාවෙන් බැලුවේය. මදක් ඈත පාතින් පෙනුණේ කලපු දියයි. ඊ මට, ඉහලට නැගුණු පොල් ගස්වල මුදුන් යන්තමට පෙනුණි. කවුළුව පාත වූයේ ලියන මේසයකි. එහි පැන් කීපයක් දැමූ වීදුරු බඳුනක්ද, ගන්ද කෝප්ප දෙකක්ද ලියුම්ව පාවිච්චි කරන කොටස වසා ගත් තැනී රෝස පැහැ කාඩ් බෝඩ් කැල්ලක්ද විය. එය දෙපත්තෙන් පමණක් රාමු කරන ලද්දකි. ඒ දුඹුරු පැහැ කාඩ්බෝඩ් රාමුවේ තිරස් රන් ඉරි ඔකා දැගින් විය. මේ මේසයත් ඒ මත තිබූ දෙයත්, ඒ අවට වූ පුටුවත් සියල්ල යම් කිසි අතීත අවධියක් සිහිපත් කළේය.

මේසයෙන් එපිටට වූයේ සුව පහසු ටියන් ඇඳකි. සිහින් ලා කහ ලා නිල් මල් වටුන් රෙද්දක් ඇඳ වසා ගත්තේය. මේ කාමරයේ බිත්තිද ලා නිල් පැහැයක් විය.

"මේ කාමරේ උපසේනට" කාලිංග කීවේය.

"මට ?"

"ඔව් ටිකක් විවේක ගන්න. ඔයාගෙ බෑග් ආවම අපි අවදි කරන්නං."

උපසේන ගොළුවිය. තමා ආවේ විවේක ගන්නට නොවේ. ගමනක් යන්නටයි. කතරගම යන්නට-- කතරගම ගිහින් අතරමග වෙන කතාව සිහිපත් සිතුවිය.

"ගොඩක් රෙස්ට් කරන්නකෝ" කී කාලිංග පිටව ගියේ දොර වසමින්.

වියන් ඇඳ තිබුණ බිත්තියට විරුද්ධ පැත්තේ තිබූ බිත්තියේ දොරක් විය. උපසේන කුතුහලයෙන් එය විවර කර බැලුවේය. සියලු සැප පහසු කම් සහිත නාන කාමරයක් - දිය තටාකයක් - නාන දිය මලක් - සින්ක් බේසමක් - නැවුම් තුවා - සුවඳ සබන් - පයට සුව දෙන ගඩොල් ඇල්ලූ බිම - උපසේන මුහුණෙන් වතුර ටිකක් ඉස ගෙන කුඩා තුවායකින් මුහුණ පිසදා ගත්තේය. නාන මලට එපිටින් සිහින් දිග කවුළුවක් විය. එහි වීදුරුවෙන් එයින් පැහැදිලිව ඔහුට පිටත පහත වූ කලපුව දිස්විය.

ඇත්තෙන්ම පිටත වූයේ සුන්දර දසුනකි.

කලපු දිය මිණි අඳුරේ තද නිල් පැහැයක් විය. පොල් අතු තද කොළ පැහැයෙන් දිලිසුණි. පොද වැස්ස තවමත් ඇද හැලුණේ නිසල කඩතුරාවක් ලෙසිනි.

නිදන කාමරයට ආ උපසේන ප්‍රධාන දොර හරින්නට තැත් කළේය. එය පිටින් අගුළු ලා තිබිණි!

මොහොතකට උපසේන කැළඹුණේය.

කාලිංග පිටින් දොර වසා යන්නට ඇති. තමාට විවේක ගන්න අදහසින් එසේ කරන්නට ඇති. දොරට තට්ටු කොට වැඩක් වේද?

ඔහු එසේ කළත් පිළිතුරක් නොවීය.

මොකක්දෝ හේතුවකට උපසේනට සිනා නොවී සිටිය නොහැකි විය. මේක නම් අපූරු විහිළුවක් - මා, මේ ආවේ මොන ගමනක්ද? මොන වික්‍රමයක් සොයා ගෙනද?

කාලිංගට ඕනෑ මොනවාද?

කාලිංග කවුරුද?

කාලිංග දියවඩන - නිලමෙ කෙනෙක්ද?

උපසේන ඇඳෙහි හිඳගත්තේය. ඇඳ ඉතාම සුව පහසු එකකි. පුළුන් පිරූ මෙට්ට කොට්ට සියල්ල සැහැල්ලුය. සුවදායකය. උපසේන ඇඳෙහි ඇලවුණේ තවම දවය ගතට ලා ගෙනය. අනතුරුව අලස ලෙසින්ම ඔහු තම පාවහන් ගලවා දැමුවේය. ඒ ආකාරයෙන්ම බඩ ගාගෙන උරගයෙකු සෙයින් ඇඳට ඇදුණේය. ඕනෑ දෙයක් වෙච්චා දෙන් කියන උදාසීන හැඟීමක් ඔහුගේ ගත සිත ගිලා ගත්තේය.

ඇසෙන් ඇලවුන ඔහුට ඉහළ විදුලි පංකාව සෙමින් කැරකෙන ආකාරය පෙනුණි. සිවිලිම සේම පංකාවද සුදු පැහැයකි. ඒ සියල්ල කුමරාය වෙද්දී උපසේන දෑස් පියාගත්තේය. සුව නින්ද ඔහු මත වන්නට දැඩි වේලාවක් ගත නොවීය. තමා බිව් තේ කෝප්පයේ නිද්‍රාජනක ඖෂධයක්වත් තිබුණාද?

කාලය ගැන වගක් නැතිව ඔහු නිදාගත්තේය.

ඒ අතරේ ඔහු ඉතා පැහැදිලි සිහිනයක් දුටුවේය.

තමා, ගෙදර ඇවිත් සිටියේය. සුසාත්, පුතාත් කෑම මේසය අසල හිඳ සිටියහ.

"කොහෙද මෙච්චර කල් හිටියේ?" සුසා ඇසුවාය

" අපි හොඳටම බය උනා "

උපසේන තම කමිසයේ බොත්තම් ගලවමින් සිනාසුනේය.

" තාත්තා නොකියා යන්න එපා " බිමල් කීවේය

"මං වැස්සකට අහු උනා." උපසේන කීවේය

"හරිම මුරුගසන් වරුසාවක්."

"මුරුග සන් - මුරුගසන් ?" බිමල් කීවරෙක් කී වදන් දෙසවන ඇසෙමින් උපසේන සිහිනයෙන් අවදිවූයේය

"මුරුග - ස - න්" ඔහු තොල් මතුරුවේය

"මුරුග - සන් - - මුරුග - මුරුග."

උපසේනට මතකයෙක සිහිපත් විය. ඔ! උංගට කතරගම දෙවි රූපයක් - මුරුගා - - මුරුගා - තමා ආයේ කතරගම යන්නම නොවේද? කතරගම හා රාවණගේ සම්බන්ධය සොයන්නට.. දැන් තමා කතරගම යන්නේ කොයි වෙලාවටද?

ඇසෙන් කඳුළක් උපසේන. තම පුතා බිමල් ගැනත්, බිරිඳ සුසා ගැනත් සිතන්නට වූයේය. තමාගේ දුරකතනයේ ගැලරියේ බිංදුවක් හෝ ඉතිරිව ඇත්නම්...? ඔහු දුරකතනය සොයන්නට වූයේය. දුර කථනයට මොකක් උනාද? තමා, එය සාක්කුවේ ලා ගත්තාද? කාලිංග තමාගෙන් එය අරගත්තාද? තමාගේ බෑගය මේසය අසල බිම තිබිණි. උපසේන වී නැගී හැමතැනම දුරකතනය සෙව්වේය. එය කොතැනකවත් නොවීය. යම් කිසි ආවේශයකින් ඔහු බෑගය ඇඳ මත හෙළා ඒ තුළ වූ රෙදි පෙරෙදි සියල්ල එළියට ඇද දමමින් දුරකතනය සෙව්වේය. යළිත් සාක්කු තුළ බැලුවේය

දුරකථනය නැත!

තමා හා පිටස්තර ලෝකය සමඟ තිබුණු එකම පුරුකත් බිඳී ගියාක් මෙන් ඔහුට අමුතුම බියක් දැනුණි හරියට වලකට වැටුණු තමාට එයින් ගොඩ ඒමට තිබූ ඉණිමඟ නැති උනාක් මෙනි. මේ අගාධය කොතරම් ගැඹුරුද?

ඔහු දොර ළඟට ගියේය.

දොර තවමත් අගුළු ලා තිබිණි.

මේ මොන විහිළුවක්ද?

තමා කෑ ගැහුවොත්?

තමා දැන් කාගේවත් සිරකරුවෙකු බවට පත්වෙලාද? කාලිංග මේ කරන විහිළුව කුමක්ද?

ඔහු නාන කාමරයට ගියේය. තම මූණ දිය ගැස් කළේය. නාන කාමරයේ දිග ජනේලය වීදුරු තැටි නොහැකි වීදුරු පලුවකි. ඔහු යළි නිදන කාමරයට ආවේය. මෙවැනි අචල වූ ජනේලයේ පලුවක් ඔහු ඇරගත්තේ මහත් වෑයමකිනි. එතැනින් බැලූ ඔහුට පහත කොතරම් පහතදැයි පෙනුණි තමා පහතට පැන්නොත්... ඊළඟට...?

සීත සුළඟක් හිරිගඩු නංවමින් කාමරයට එබී ආවේ තිර රෙදි නටවමිනි.

උපසේන ජනේලයෙන් පනින්නට සිතුවා පමණි ඔහු කවුළු පඩියට පයක් තිබ්බා පමණි

කාමරයට එන දොර විවර විය.

එතැන සිටගෙන සිටියේ කලු දිග කබාය ඇඳගත් සේවකයෙකි. මේ උපසේන පෙර නොදුටු මිනිසෙකි. ඔහු කලුය. සිහින්ය. උසය. දෑස් තරමකට ගිලී ගියාක් මෙනි. දෙකොපුල සිහින්ය කෙසේ කිඳී යමිනි.

“ආපන සර් - එන්න කෑමට -” ඔහු වයසක හඬකින් කීවේය.

“කවුද? කොහේද?”

“අනේ ලොකු මහත්තයා - මං කවුද?” සේවකයා කෑම් කළේ ඇද ඇදලාය

“මං යන්න ඕනෑ - කතර-ගම.” උපසේන කීවේ වේගයකිනි.

එය ඇසුනාක් මෙන් සේවකයා ඇරුණු කවුළුව ඔහුට ගොස් එය ඇද "දඩස්" ගා වැසුවේය. අගුල තද කළේය.

"මේවා අරින්ට එපා - කිව්වනෙ!" ඔහුගේ කටහඬේ යම්කිසි තර්ජනයක් විය.

"මං කොහොමද එයා ඒක දන්නෙ?" උපසේන දොර වෙතට යමින් කීවේය.

සේවකයා දොර වෙතට එමින් දෑස් බැල්මක් හෙළුවේය. ඒ දෑසේ වූයේ මහා පුදුම පෙනුමකි. සොයාපත නොහැකි, කෙමෙන් නැමට කිසු බැරෑරුම් නැතුවක්..

"මේ-" උපසේන සේවකයා වෙතට ළංවූයේ නොසිතාමය. "මට තමුසෙත් එක්ක ප්‍රශ්නයක් නැහැ. මට මගේ ගමන යන්න ඕනෑ - තේරුණාද?"

තේරුණා බවක් පෙන්වන බැල්මක් සේවකයා ඔහු හෙළීය.

"මේ මට - සර් එක්කත් ප්‍රශ්න යක් නෑ" සේවකයා මෙවර කීවේය. "මම වැඩ කරන්නෙ අපේ ලොකු මහත්තයා කියන විදියට - තේරුණා නෙ?"

"ලොකු මහත්තයා - හරි - හරි - මට තේරුණා." මේ මනුස්සයගෙ පඩි නඩි ගෙවන්නෙ 'ලොකු මහත්තයා' නෙ. ඉතින් දෙකට නැමිල වැඩ නෙ ඉන්න ඕනෑ ඇති. ලොකු මහත්තයානෙ ජීවිකාව...

"මේ - තමුසෙගෙ නම මොකද්ද?"

"මගෙ නමද සර්?" මෙවර සේවකයා යළිත් නියාදු ස්වරයෙන් කීවේය.

මේ මිනිහා බොත්තං ඔබන කොට වෙනස් වෙන සිලෙන්ඩර් එකක් වගේ - උපසේනට සිතුණි. තමා සුසාට කැඩි අරන් දුන් නොයෙක් ප්‍රශ්න වර්ග පරීක්‍ෂා කළ හැකි, සිලෙන්ඩරය - විද්‍යුත් මිනිසා - උපසේනට සිතුණිය. එහි එක එක බොත්තම් එබූ විට එක එක දෑය කරයි. - ටොප් - ප්ලේ. ප්‍රයින්ඩ් - ස්ටොප් - පියුරේ - විප් - මික්ස් -- සිලෙන්ඩ් - ඉටැෂ් - ලික්විනයි - එනම් - ඔත්පැසීම, පෙරන්ගෑම, ඇඹරීම, කැලතීම, පලං කිරීම, තැලීම, මිශ්‍ර කිරීම, කලවම් කිරීම, ඔතා ගැසීම, දිය කිරීම ...

මේ හැම බොත්තමම ඔබද්දී ඇතුළත ක්‍රියා දාමය වෙනස් වෙමින් හඩ වෙනස් වෙයි- මේ මිනිසාද එසේමය. තමා බොත්තම ඔබන විදියට - තමා ඔහුට අණ්ඩනුරාය කරන විලාසයට ප්‍රතිචාරය වෙනස් වෙයි

කොයි මිනිහාත් එහෙම නොවිදියි උපසේනට අනතුරුව සිතුණි. නමා ඒ මිනිහාගේ සිත දිනා ගන්නට හරි බොන්නට එබිය යුතුය. වඩාත්ම සුදුසු ඇඟිලිකමයි - හඳුනා ගැනීමයි. දොර හැර ගැන්මට - එක පයක් ඇරලා දොරට තැබිය යුතුයි 'නුඹ ඉන්ද බෝ' කියන්නෙ ඒ ආකාරයට. දොරට - පයක්

"ඒ ඔව් - ඔයාගෙ නම - ?"

"මම යූනෝ" සේවකයා කීවේය.

"යූනෝ?"

"ඔව් - සර් මගෙ නම යූනෝ."

උපසේන නැගී ආ සිනාව වියයෙන් නවතා ගත්තේය. යූනෝ? ඒ නමින් කාඩ් සෙල්ලමක් තියෙනවා නේද? යූනෝ - යූනෝ කියන්නෙ එක කියන එක.

"යූනෝට කවුද නම දැම්මෙ?"

"අපේ ලොකු මහත්තයානෙ."

"හරි - හරි" මෙහෙකරු දුටින් - උපසේන සිතුවේය. 'මේ මිනිහා මෙතන බැඳිලා වැඩ කරන සේවකයෙක්. ඉස්සර අමෙරිකාවෙ සුද්දෝ අප්‍රිකාවෙන් වහල්ලු විදියට කළු මිනිස්සු ගෙනාවම ඒ මිනිස්සුන්ටත් මෙන මෙන නම් දැම්මනෙ? සුද්දගෙ කටට ගැලපෙන නමක් - කොච්චර හරි උන් ශ්‍රී ලංකාවටත් සිලෝන් කිව්වනෙ - කටේ පහසුවට ... යූනෝ...

"හොඳයි යූනෝ අපි ඉතින් යමු කො ලොකු මහත්තය හම්බුවෙන්ට."

උපසේනට වැදගත් වූයේ කෙසේ හෝ ඒ කාමර දොරෝ විවෘතවීමයි, එහෙත් ඔහු නිරතුරු බෑගය තමන් ඇඳ මත තිබිණි. එයින් තම පවතට අද ඇඳ මත දමූ රෙදි සෙරෙදි ඒ ආකාරයෙන්ම - හැම තැනම - තමාගේ සරම - නවාය - අනෙක් කමිසය. උපසේන ඒවා බෑගයට දමන්නට සිතා එතැනට ළංවූයේය.

"ඔච්චර, ඔහොම තියෙන්ඩ සර්. දැන් ආයෙත් ඔබට එනවනෙ.."

"නෑ මං හැබැයි මෙහොමම යන්න."

"නෑ - සර්ට එන්න කීවෙ රෑ කෑමට."

"රෑ කෑමට?"

"ඔව් සර් - රෑ කෑමට -"

"එච්චර දෙ වුණාද?"

"එච්චරම දෙවුනේ නෑ සර්... අපේ ලොකු මාත්තය විලාසිතාත් දෙට කනවා. ඊත් උත්සවයක් තියෙන දෙට කෑම වේල දෙකක් තියෙනවා. එකත් විලාසින... ආයෙත් දෙ දෙදහට විතර.. කාලා - බීලා ජොලි කරනවා.. ඔව්වා ඔහොම තියල එන්න සර් -"

උපසේන ඩිංගය අසූරන්නට අරඹනු වූ උතුනෝ කීවේය. "යමු - යමු." මොර සිංගේ කටහඬ සියුම් කම්පනයක් එක්විය. බ්ලෙන්ඩරයේ ස්විච් එකක් ඔනක් උනා වාගෙ?

උතුනෝ කාමරයෙන් පිටව උපසේනට පිටවෙන්නට කියන්නාක් මෙන් නම් අතක් දිගුවේය. උපසේන පිටවෙන්ට උතුනෝ දොර ඇර වැසුවේය.

"කාමරේ පරිස්සම සර් - මෙහේ කොහොත් නැති වෙන්නෙ නෑ. මෙහේ හොරු නෑ සර්." පඩිපෙළ අතට යන අතරේ උතුනෝ කීවේය.

"එහෙනම් මගෙ සෙල් එකට මොකද උනේ?"

"මොකද්ද සර්?"

"මගේ ෆෝන් එක? මගෙ ජංගම දුරකතනය?"

"ආ ඒකද? අපි කොහොමද දන්නෙ සර්? සර් දීපු තැනක ඇති."

දීපු තැනක... තමා කොහේ දැම්මාද? අර ප්‍රාචි නාග සිරි හෝටලයේ? එතැනදී තමා පුතාට ලියූ කෙටි ලිපිය? ඒකත් තමා අමතක කොට ආවා නොවේද?

"මට ෆෝන් එක හොයා ගන්න ඕනෑ - උතුනෝ. එක්කො කාරෙකේ.. එක්කො හෝටලේ.. "

"ඔව්වා දැන් හිතන්න එපා සර් - හම්බ වෙන්න තියෙන වෙලාවට හම්බ වෙයි. නැතිවෙන්න තියෙන වෙලාවට නැතිවෙයි." උතුනෝ හිනා වෙද බසිමින් කීවේය.

ඔන්න දැන් මේ මිත්‍යා දර්ශනයක් වගේ අපේ - උපසේනට සිතුනි. 'නැතිවෙන්න තියෙන වෙලාවට නැතිවෙයි' එහෙම නම් හොරු ගන්නෙත් - වෙලාවට ද?

දෙදෙනා පහත සාලයට ඇවිත් සිටියහ.

සාලයේ කිසිවෙකුත් නොවීය.

කෑම මේසය රාත්‍රී භෝජනයකට සැරසෙල මෙන් තිබුනි.

දිග කළු කබායක් හැඳගත් සේවකයෙක් මේසය මත පිඟාන් එකින් එක පිළිවෙලට තැබුවේ පෝසල් බිත්තියක් මත දැල්වූ මිටි ගෑස් කබන විලාසයෙනි. යම්කිසි ලතාවකට-සරයම යකින්.

"සර් මේ පැත්තෙ සෝෆාවක වාඩිවෙන්න" උගනෝ ඇරයුම් කළේය.

මේසය අසල මුහුණ ලූ ලොකු සුව අසුනක කොළරක හිඳගත් උපසේන අවට බැලුවේය. අවට බිත්තිවල ~~ඉල~~ ඉලින් ඉල චිමිනි ලාම්පු දැල්විනි. ඒවායේ රන් කහ එළිය ඉලින් ඉල ආලෝකමත් කළ අතර මේසය ඉහලින් වූ පහන් වලල්ලක මැද වඩාත් ලොකු වීදුරු චිමිනියක් සහිත ලාම්පුවක් දැල්විනි.

" තාම ලැයිට් ආවෙ නෑ සර් " උගනෝ ඓයාද හඬින් කීවේය. " ලයිට් ආවම ඔය පහන් වලල්ල ගින්දර වගේ පත්තු වෙනවා. අද නම් භූමිතෙල් ලාම්පුවල පිහිට තමයි. "

පහන් වලල්ලේ රැඳුණු අතරට වූ විදුලි බුබුළු දැන් උපසේනට වඩාත් පැහැදිලි විය. 'ෂැන්ඩලියර්' යනුවෙන් ඉංග්‍රීසියෙන් හැඳින්වෙන්නේ මෙවන් විදුලි පහන් වලලුය. නමුත් මේ වලල්ල මැද භූමිතෙලින් දැල්වෙන චිමිනි ලාම්පුවක් තිබීම මෙවන් පරිසරයක වඩාත් උචිත විය. අර බිත්ති වල ~~එළිය~~ ද රඳවා ඇති චිමිනි ලාම්පු ද කියා සිටියේ මේ ගෙදරෙහි විදුලි බලයෙහි තිබිය හැකි අස්ථිර ස්වභාවයයි.

"මං යනවා සර්" කී උගනෝ නැමී ආචාරයක් හා පිටව ගියේය.

උපසේන මේසය මත පිඟාන් පිළිවෙලට තබමින් සිටි මිනිසා දෙස දැන් වඩාත් උවමනාවෙන් බැලුවේය. හිස කෙස් පස්ස පසට පීරූ පැහැපත් මුහුණින් යුතු මැදිවියේ මිනිසෙක් - සන්සුන් ඉරියව් - සන්සුන් පෙනුමක් - ඔහු උපසේන දෙස බැලුවේත් නැත. උපසේන හිඳිනා වගක්වත් මේ මිනිසා නොදනියි. උපසේන උපර පැටුවේය.

උපසේන තම අත බැඳි ඔරලෝසුව දෙස බැලුවේය. තවම හතලිස් පහයි--. වෙලා බෑ. -පිටත රාත්‍රිය මෙන් නූගෙයි.

එහෙත් උපසේනට පිටත බැලිය හැකි කවුළුවක් මේ ශාලාවේ නොවීය. ඔහු යළිත් තම අත් ඔරලෝසුව දෙස බැලුවේය. තවමත් එකොළමයි. තුනයි හතළිස් පහයි- ඔරලෝසුව නැවතී තිබිණි. තුනයි හතළිස් පහට.. මේ ශාලාවේ කොතැනකවත් හෝරා යන්ත්‍රයක් නොවීය.

උපසේන නැගිට යන්නට සිතුවා, [illegible]. දුම් දමන ලොකු බඳුනක් දෝතින්ම ගත් තරබාරු ගෘහණියක්, උපසේන හිඳ සිටි සෝෆාව පසෙකින් බිත්තියේ වූ දොරකින් ඇතුළට ආවාය. උපසේන යළිත් හිඳ ගත්තේ නොසිතාමය. ඔහුව නැවැත්වූයේ ඇගේ තරබාරු සිරුර හෝ ඇය හැඳ සිටි කිරිසෝ ඉරිවුවූ දිග සාය හෝ බෝරිච්චි අත් සහිත කහ පැහැ හැට්ටය නොවේ. ඇගේ අතේ වූ බඳුනෙන් නැගී කටට කෙළ උනන සුවඳයි.

උපසේනට එක්වනම බඩගින්නක් දැනුණි.

ගෘහණිය මේසය වෙතට ගමන් ගත්තේ උපසේනව ගණන් නොගනිමිනි..

මේසය වට, විගස තබමින් සිටි මිනිසා යන්නට හිස ඔසවා යළි තම කාරියට අවධාන වූයේය. ගෘහණිය දුම් දමන බඳුන මේසය මැදට තබන්නට නැමුණාය. උගුර යටින් මෙන් යමක් කීවාය. කිසිවක් පැහැදිලි නොවීය. සේවකයාද යටි උගුරෙන් මෙන් හඬක් නැගුවේය. "හරි" කියන්නාක් වැනි හඬක්. අනතුරුව ඔහු හා ගෘහණිය ඇතුල්වූ දොරෙන්ම පිට ගියේය.

උපසේන උගුර පෑදුවේය.

ගෘහණිය එක විලෙල් ඔහු දෙස බැලුවාය.

ඇගෙන් කුමක් අසන්නදැයි උපසේනට එක්වරම සිතාගත නොහැකිවිය. ඇගේ විවර ලොකු දෑසේ බූසේ ආකර්ෂණීය පෙනුමකි. දිග ඇස් පිහාටු. කවාකාර ඇහිබැම. ඒ දෑස් වලහෙනකගේ දෑස් මෙනි. මුවැත්තියකගේ දෑස් නම් නොවේ. මුහුණේ තෙල් පිපුණු ගතියක් විය. මුහුණ කහ පැහැයකට හුරුය. නැහැය ලොකුය. දෙකොල ඉල්ලිලුණු. හැට්ට කර ලොකුය. එය මැදින් පියයුරු බෙදන ගැඹුරු රේඛාවක මදක් පෙනේ. පියයුරු ලොකුය. දෑත්වලද මස් පිරුණු ගතියක් වෙයි. ගමන සෙමින් වුවත් ස්ථාවර බවක් වෙයි; අලස නොවේ.

"මේ" උපසේන යළිත් උපුරා පෑවේය. ඈ නැවතුණාය. ඔහු දෙසම බලා සිටියාය.

"අර - ලොකු - මහත් - තයා දැන් එනවද?"

"ආ? ලොකු මහත්තයා ඒවි. දැන් බඩගිනි වෙලාවනෙ"
ඈ යන්තම් සිනාසුණාය.

ඈ මෙහි දැනී සැලකීම බව නිසා තමාට කතා කළ හැකි බවක් උපසේනට දැනුණි.

"ඔයාද කෑම උයන්නෙ?"

"නැතුව වෙන කවුද?" ඇගේ කටහඬේ මඳ නොරිස්සුමක් වුවද එහි ඇඟෑලුම් ගතියක්ද විය.

"උදව්වට කවුරුවත් නැතිද?"

"අයොයි ඉන්නවා - දෙන්නෙක්ම ඉන්නෙ - කමකට නැති අය - මං නැත්තං මෙතන ඉතිං යුද්දයක් තමයි."

උපසේන තනිවම සිනාසුණේය. ඇගේ විදගත්කම ඈ දනියි. ඈ නැත්නම් මෙතන වැඩක් කෙරෙන්නෙ නෑ. දැන්නම්ම කෑම ටික උයන්නත් කවුරු හරි එයායි. ඈ නැත්නම් 'ලොකු මහත්තයා' බඩගින්නෙ ඉඳීවිද? නැත්නම් ලොකු මහත්තයා ගාලු සිරි හෝටලේට ගිහින් මාළු පාන් කාලා ඒවි...

"මට තේරෙනවා -" උපසේන තවත් ඇඟිලි කමින් කතා කළේ ඇගෙන් තව තොරතුරක් දැනගන්නා අටියෙනි "කොහෙද ඉව්වෙ? සුවඳයි."

"මේ එළොලු සුප් එක." ඈ යන්තම් සිනාසුණාය. "එළොලු කෑවට කී ජාතියක් දාල හදනවද?"

"මොකද්ද ඔයාගෙ නම?" උපසේන ඇසුවේය.

"මම?" ඈ හනුවට අතක් තබා ගත්තාය. කොහොත් උවමනාවෙන් ඇගේ නම ඇසූ මුල් අවස්ථාව මෙය විය හැකිය. "මම ටිරේසා"

"මී" "තෙරේසා?"

"නෑ නෑ - ටිරේසා."

ටිරේසා - තෙරේසා - මොකද්ද වෙනස? නෑ ඕව ඇගේ නම විදගත් නෙ - ටිරේසා.

"ලොකු මහත්තයා මට කියන්නෙ ටිරේසා කියලා."

'ලොකු මහත්තයද නම දැම්මෙ?' කියා අසන්නට

සිතුළින්ත් උපසේන බුව පියා සිටියේය.

~~මේසය පිළියෙල කරමින් සිටි සේවකයා, උපසේනට ගණන් නොගෙන මෙන්, විරේඛා ගැමිණි දෙරෙන් පිටව ගියේය.~~ විරේඛා ව්‍යාකූල බවක් පෑවාය.

"අනිත් කෑම ටික මේසෙට අරින්න ඕනෑ - විජාට" කියමින් ඇය ගැමිණි දෙරෙන්ම පිටව ගියාය.

උපසේන ගෙල දිග කරමින් ඇය අතට ගැරී ඇය ගිය දිසාව බැලුවේය. ඒ දෙරෙන් පිටත වූයේ අඩ අඳුර කොරිඩෝවකි. එහි කෙළවර රතු පැහැ ආලෝකයක් දිස් විය. ඒ මුළු තැන් ගෙය විය යුතුය. එහෙත් ඒ දෙස වූයේද නිහඬ භාවයකි.

මේ ගැමු මූසල තැන කොහොමද ඉන්නේද? උපසේනට සිතුණි. මෙතැනින් ගිය තරමට හොඳයි. දැන් ඒ ගැන ද කෑමක්... කැස්බියට ගොස් බලන්නට සිතුණත් උපසේන හිටි තැන ඉල් දැද්දුක් මෙන් අලස බවකින් ගැලී සිටියේය.

තව මඳකින් විරේඛා තවත් ලොකු බඳුනක් දෑතින්ම ඔසවා ගෙන ආවාය. — බත් බන්දේසියකි. ඇය අනුව අනූ පැදගත් සේවකයින් දෙදෙනෙක්. තරුණ විය ඇසු කරන පිරිමින් දෙදෙනෙක්. අනූ දිග කබා -- අනූ සරම්. ඒත් අයෙක් තට්ටයෙකි. මලක් තරබාරුය. අනෙකා වඩාත් උස මහත නොවේ. බොකුටු කෙස් සහිත හිසකි. දෙදෙනාම මේසය වෙතට ගමන් ගත්තේ බඳුන බැගින් ඔසවා ගෙනය. විරේඛා අනුවම, තම බඳුනද මේසය මත තැබුවාට ඇය ඒ තිදෙනාම යළිත් මුළු තැන් ගෙය අතට ගමන්ගත්තා. උපසේන යමක් අසන්නට තුන් කළද එයට කාල වේලාවක් නොවීය.

උපසේන නැගිටියේ ඔවුන් දෙරෙන් පිටව ගියාට පසුවය. ඔවුන් ගිය අතට හාමා වෙනුවට ඔහු මේසය වෙතට ඇවිදගියේ කුතුහලයකිනි. මේසය මත සුප් බඳුනත්, ලොකු බත් බඳුනත් හැරෙන්නට අනෙක් බඳුන් දෙකකි. තෙල් දැමූ අලත්, හොද්දට ඉස්සෝ මස් වගයකුත් විය. බත් - කෑම බත් - උපසේනගේ කටට කෙළ උනුවේය. බඩගින්න වඩාත් තීව්‍ර විය. /තීව්‍ර/ ඔහු මේසය ඇසු කරගෙන තමා මෙතැනට ගැමිණි - ඇතුළත් අතුළතා දෙර වෙතට ගියේය.

දැන් ඒ දොර වසා දමා තිබුණි.

උන්නෝ යනවිට ඒ දොර වසාගෙන යන්නට ඇති. උපසේන තික්කම දොරට අත තබා බැලුවේය. දොර අගුල් ලා, වසලාය.

'මේ මොකද?'

උපසේනට හීන් දහඩිය දැම්මේය.

තමා මෙතැනින් පිටව යන්නේ කෙසේද? පිටත එක්වනම දැකීම වැස්සස වුවමනාට විය. එහෙත් පිටත පෙනෙන තැනක් (කවුළුවක්) මේ ශාලාව තුළ නොවීය.

වීරේකනේ අනික් සේවකයින් දෙදෙනා යළි බඳුන වැගිම් මේසයට ගෙන ආහ. පරිප්පු-බඳුනක්- රටළූණු-තක්කාලි සම්බෝලයක්. කොළ මැල්ලුමක්. සියල්ල පහන් එළියට දිලිසුණි

"කෑම ටික කෑව හැටියෙ මෙතනින් යන විදියක් බලන්න ඕනෑ" උපසේන සිතුවේය. සිහින් දහඩිය අතරේ කටට කෙළ උනයි. බඩගින්න දැනිණියි. "ටැක්සියක් ගෙන්න ගත්තාම හරි- නොහොත් බුරි නම්- කෝච්චියක් අරන් කොළඹට යනවා. නැත්තං කලුතර නානායමක නවතිනවා- අපේ බොස්ට මොනව උනාද? මේ කාලිංගයා මොනව කරනවද?

එක්වනම ඩිං ගා හඬක් නැගුණි. උපසේන තිගැස්සුණේය. මධුර සීනු හඬක්. ඊ දැගට තව පස් වතාවක්. ඩිං-ඩිං-ඩිං-ඩිං-ඩිං! ඔරලෝසුවක හය වදින හඬ- එකම/අස්වැසුම- වෙලාව රාත්‍රී හය බව දැනගත්තේමයි.

තමා එහෙට ආවේ ඒ ඇවිද වෙලා නැත-

සීනු හඬ සමග සේවකයින් තිදෙනා පිළිවෙළකට මෙන් පිටව ගියහ.

සේවකයින් ගිය අතට යන්නට උපසේන සිතුවා පමණි. මෙහෙත් වසා තිබූ දොර තීරිව කාලිංග එතැන ප්‍රාදුර්භූත විය. දැන් කාලිංග හැඳ සිටියේ ඉණෙහි දිග ගාතට වැටෙන රෙදක් දිසාවු ඕරා කතා ලෑ කවියක් වැනි අත් කැපිත කමිසයකත් ඒ ළඟයම සිලු කලිසම කත්‍රය. දනේම ඇඟිල්ලිවල මුදු රනින් දිලිසුණි.

"ආ- උපසේන- වෙලාව නැගිට්ටද?" කාලිංග හඬ බරකොට ඇසුවේ උපසේන ඔහු දෙසට හැරෙද්දීමය-

කාලිංග පිළිසඳරු ඉතර යාන්ත්‍රානුසාරයෙන් ඉවත්ව වැසුණි. එහෙනම් මේ මිනිහා දැය දෙර අභිනය මනින්න නොහැකි ඇති - උපසේනට සිතුණි. හරියටම අර ජේම්ස් බොන්ඩ් චිත්‍රපටියක වගේ. මේ මිනිහා චිත්‍රපටි බලලා ඒවා අනුකරණය කරනවා වෙන්නැති?.

"බඩගිනිද? අපි කමුද?" කාලිංග තවත් සිංහ වෙමින් කැළඹ ගිය ඇසුවේය. "හොඳට නිදි ගත්තද?"

"ඔ - ඔව්." මේ මිනිහාට දෙවැනි වෙන්න තරකයි, උපසේනට සිතුණි. ඔහු අනතුරුව 'තැන්ක්‍යු' කියා එකතු කළේ සම තැනකට එන ආකාරයෙනි.

"අපි කෑම ටිකක් කමු. අපේ ගිරේසා රසට කෑම උයනවා."

"ඔව් මට හම්බු උනා. අපි කාපි කෑවා."

මේ හොකකට කාලිංග හිනැහුණි විය. හිනැහුවම මේසය වෙතට අත දැවේ ඉඳගන්නට කරන ආරාධනයක් ලෙසිනි.

අර ලස්සන නැද සිටි ආවතේවකාරයන් දෙදෙනා මේසය වෙතට ඇවිත් සිටියහ. තට්ටයා කාලිංගගේ පිගානට බත් මාලු සිනි බෙදු අතර, බොකුටු කොස් ඇත්තා, උපසේනට ආවතේව කළේය. කාලිංග ප්‍රධාන ආසනේ තිද සිටි අතර උපසේන ඔහුගේ වම් පසින් තිද සිටියේ.

"අද ලයිට් නෑ" කාලිංග කියද්දී 'එහෙමනම් මේ ඉළුම් ආලෝකය කොහෙද දැයි යන්න උපසේනට ප්‍රශ්නයක් විය.

'නෑ නෑ විදුලිය තියෙනවා' උපසේන සිතුවේය. 'මේ මිනිහා මට කොළේ වහන්න මේ සෙල්ලම් කරනවා - එමෙන් ලමිනු නන්ද කෑම මහලාගේ ගතියක් තියෙනවා. මගේ හිත දිනාගන්න කරන උපායමාර්ගයක් මේක' උපසේන තමාටම කියා ගත්තේ මුලම බත් කට ගන්න අතරේය. කෑම ටික ඇත්තටම ප්‍රණීත විය.

"මේ ඉන්නෙ කට්ටමිරෙ" කාලිංග හිටිට කෑම බෙදන තට්ටයා පෙන්වමින් කීවේය. කට්ටමිරෙ යන්නට සිනාසුණා වමින් "සිය ඉන්නෙ දෙ'සෙ" බොකුටු කොස් ඇත්ත කෝකියා දෙස බලමින් කාලිංග කීවේය.

'අමුතු නරි' උපසේනට සිතුණි. එහෙත් කිසිවක් අසන්නට සිත හිත දුන්නේ නැත.

"සේරම මගෙ නිතරම් සේවකයෙ - මෙහෙම තමයි ඉන්නෙ"

"හරි - හරි."

සේවකයින් දෙදෙනා මේසයෙන් වලක් ඇනට ගොස් කාලිංගට පිළිගැනීම දෙපසින් සිට ගත්හ - සෙල් ටිලිම බෝ නොබෙල්වී -

උපසේන බත් රස විඳියේය. කාලිංග තලු මරමින් නිතැනියාව වඩිමින් උසුලේහ දැස්බෙර අගනාව හල රමණි. මද වේලාවකට පසු උපසේන, "මං ඉතිං යන්න ඕනෑ" යි කීවේය.

"ඇයි හදිසි?"

"නෑ - මං අරගෙ කනරටම යන්න නෙ - මගෙ බොස්."

"අ, බොස්ට අද එන්න වෙන්නෙ නෑ කිව්වනෙ."

"ඒ කොයි වෙලාවෙද?"

"එතකොට උපසේන නිදි - මං කතර කරන්න ගියෙ නෑ"

"මොනවද කිව්වෙ?"

"මගෙ ෆෝන් එකට කතා කරල කිව්වෙ. අද එන්න වෙන්නෙ නෑ. කියලා"

"වෙන - මොනවද කිව්වෙ?"

"වෙන මොකුත් නෑ." කාලිංග බත් කටක් කෑවේ තලු මරමින්.

"හෙට එනව කිව්වද?"

"හෙට උදේ බලමු."

"මං එහෙම නම ගෙදර යන්න ඕනෑ - මාව නාරට ගිහින් දාන්න. මං බස් එකක හරි කෝච්චියක හරි - වෑන් සියක හරි නැගල යන්නම්" උපසේන කීවේ නොඉවසිල්ලෙනි.

"කලබල වෙන්න එපා. කෑම ටික කාලා ඉන්න. තාම නරේම වහිනවා - අ, ෆෝන්වලට? විදුලිත් කොටනවා ගොරවනවා. ටිකක් මේ වැස්ස තුරල් උනාම මමම ගිහින් ස්ටේෂන් එකට දාන්නම්."

"තැන්ක් යූ."

"කොහොමවත් කලබල වෙන්න එපා උපසේන. කෑම ටික කන්න - රස විඳින්න. මේ කොහොමත් ජීවිතේ වෙන්න,"

උපසේන හැබැයිම කෑම රස විඳින්නට පටන් ගත්තේ ඉන් පසුවය. තමා නිකරුණේ කලබල වූවා යැයි ඔහුට සිතුණි.

මේ මිනිහා නරක මිනිහෙක් වෙන්න බෑ. ඇත්තටම මට කළේ උදව්වක් - වාහන කොට මාව මෙතැන්ට එක්ක ගෙන ආවා - බොක්කට කෑම කෑවා නිදි ගන්න කාමරයක් දුන්නා. දැන් මේ රට කෑම හැලා දුන්නා.. මේ මිනිහා හිතන කරන විදිය වෙනස් - නරකක් නෙමෙයි - වෙනස් - වෙනස් විදියකට තමයි ලංවීම-- උපසේන කෑම කන අතරේ කාලිංගට සවන් දුන්නේය. කාලිංග කිව්වේ තම ඉමාමියන්ගේ ඉතිහාසයකි. එය පොතක් ලියන්නට වටින කතාවකියි, කාලිංග කියා ටිකක්ම කීවේ, කතාව ලියන්නට සුදුස්සා තමා දැන් සොයාගත්තා - යි උපසේන යැයි කියමිනි.

"ඔව් මට ලියන්න බැරිකමක් නෑ" යි උපසේන කීවේ මේ මිනිහාගේ හිත දිනාගෙන මෙතැනින් ඉක්මනින් පිට යන්නට හොර ගල් අදිමිනි. එහෙත් කාලිංග කියාගෙන ගිය තොරතුරු බොහොමයක් උපසේනගේ කන වැකුණාට, මොළයට වැදුණේ නම් නැත.

කෑම අවසන් විය. මෙහෙකරුවන් දෙදෙන වතුර පිරූ වීදුරු භාජනය බැගින් ගෙන ආවේ උපසේනටත්, කාලිංගටත් අත් සෝදාගන්නටයි. අතකැරුව දෝසෙ, තම වම් අල්ලෙන් ... කාලිංග රෙදි සිව් තුවා කැබැල්ලක් උපසේනට දුන්නේ අත පිසදාගන්නටයි.

'රෙක මාලිගයක ඉන්නවා වගේ නොවැ" යි උපසේනට සිතුණි. 'මේ මිනිහා ඉන්නෙ රජෙක් වගේ. තමා දැකින් ඇත්තේ රජ කෙනෙක් වගේ මිනිහෙක් උඩට. මේ මිනිහා ධනවතෙක් වෙන්න ඕනෑ - එහෙමනම් අර ගාණසිරි පොට්ටලය මගේ කනක තෝ බොන්න ආවේ? සමහර විට රජවරුන් වෙස් වලාගෙන සාමාන්‍ය ජනතාව අතරට යනවාලු... මේ මිනිහත් එහෙම යනවා ඇති - සාමාන්‍ය මිනිස්සු අතරේ ගැවසෙන්න - සාමාන්‍ය මිනිස්සු කන විදියට කන්න. සාමාන්‍ය මිනිස්සු අඳින ඇඳුම් අඳින්න.-- උපසේන වාගේ සාමාන්‍ය මිනිහෙකුට උදව් කරන්න - අඬගහගෙන කෑම වේලක් දෙන්න - තමුන්ගේ මාලිගාව පෙන්වන්න - හුවා දක්වන්න.

උපසේන උපුර ගැන කතා කරන්නට කැමති.

"හී-න් - ඒ - කාලිංග - මී - කාලිංග.. මට --
මට අපේ ගෙදරට කෝල් එකක් ගන්න ඕනෑ."

"ආ - ඔව්." කාලිංග තම සාක්කුවෙන් ජංගම දුරකථනය ගෙන උපසේනට දුන්නේය. "ආ, කතා කරන්න."

උපසේන දුරකථනය ගත්තේ දෝතිනි.

උපසේන මතකයෙන් ගෙදර නොම්මරයට බොත්තම් එබුවේය. දුරකථනය නාද විය. කිසි පිළිතුරක් නැත. සාමාන්‍යයෙන් එයා ඇත්තේ ප්‍රීති හෝ බිරිඳ පිළිතුරු දිය යුතුය. නැත්නම් පණිවිඩයකට යයි. තමාට පණිවිඩයක් තබන්නට පුළුවන. අද... නාද වෙනවා පමණි. උපසේන යළිත් වරක් නොම්මර එබුවේය. කලින් ප්‍රතිචාරයමයි. පිළිතුරු නැත.

උපසේනට යළිත් [illegible] දමන්නට විය.

"මොකද? කවුරුවත් ගන්නෙ නැද්ද?" කාලිංග බර හඬින් ඇසුවේය. ඒ දැසේ වූයේ මහා [illegible] බවකි. උපසේන ඉවත බලා ගෙන අපහසුවෙන් 'නෑ-නෑ' කීවේය. 'මේ මිනිහා මේ දුරකථනයටත් මොකද්ද උපක්‍රමයක් කරලා බොන්නැති - මට තම්බන්න හදනවා.' උපසේනට සිතුණි. 'මොකද්ද මේ මූගෙ සෙල්ලම?'

"උපසේන - කලබල වෙන්න එපා." කාලිංග සන්සුන් පහත් හඬින් කීවේය. "සමහර විට මේ වැස්ස නිසා ෆෝන් ලයින් අප්සෙට් ඇති."

"ෆෝන් ලයින්?" කියමින් උපසේන නැගිට්ටේ පුටුව තල්ලු කරගෙනය. "අප්-සෙට්?" ඔහු පුටුව තවත් තල්ලු කරද්දී එය 'දඩස්' ගා පසු අතට පෙරළුණි. ද්වේෂ[illegible] වෙන විට [illegible] වැඩිය.

බිම වැටුණු දුරකථනය අහුලාගත් ක්වාවිරෝ එය කාලිංග අතට දුන්නේය.

"මටයි අප්සෙට්" කී උපසේන වෙව්ලන්නට වූයේය.